ආරම්භය: 1930 ලි.ප. අංකය: 736
ஆரம்பம்: 1930 பதிவு இல: 736
Inception: 1930 Reg. No: 736

## සී/ස අධ්‍යාපන සේවා නියුක්තිකයින්ගේ සමුපකාර සකසුරුවම්කම සහ ණය දෙන සමිතිය

අංක 294, ගාලු පාර, කොළඹ 03.

දුරකථන අංක :011-2266000 /වෙබ් අඩවිය :www.edcs.lk

### භාණ්ඩ,වැඩ හා සේවා සැපයුම්කරුවන් ලියාපදිංචි කිරීම -2026 වර්ෂය

**කාර්යාලීය ප්‍රයෝජනය සඳහා**

අනු ක්‍රමිකතා අංකය -: ..................
කුවිතාන්සි අංකය -: ..................
දිනය -: ..................
අංකය -: ..................
අයිතමය -: ..................

1. සැපයුම්කරුගේ හෝ ව්‍යාපාරයේ නම හා ලිපිනය -:
   ..........................................................................
   ..........................................................................
   ..........................................................................
   ..........................................................................
   ..........................................................................

2. දුරකථන අංකය, ස්ථිර-: .................................... ජංගම-: ......................................

3. විද්‍යුත් තැපැල් ලිපිනය -: ..........................................................................................

4. ව්‍යාපාරයේ ස්වාභාවය (තනි පුද්ගල / හවුල් / සීමිත සමාගම්)-: ......................................

5. ව්‍යාපාරයේ ලියාපදිංචි අංකය හා දිනය (ලියාපදිංචි සහතිකයේ පිටපතක් ඇමිණිය යුතුය) -:
   ..........................................................................................................

6. නිෂ්පාදක / ආනයනකරු / මුද්‍රණකරු / බෙදාහරින්නෙකු ද යන්න -: ............................

7. ණය පහසුකම් සැලසිය හැකි උපරිම කාල සීමාව -: ..................................

8. ලියාපදිංචි වීමට අදහස් කරන සැපයුම් හෝ සේවාව පිළිබඳ විස්තරය -:
   ..........................................................................................................
   ..........................................................................................................
   ..........................................................................................................

9. සැපයුම් අයිතම අංකය-: ............. අයිතමය-: ..........................................................

10. සේවා අයිතම අංකය -:................. අයිතමය-: ..........................................................

ඉහත සඳහන් විස්තර සියල්ල සත්‍ය බවත්, සැපයුම් සේවාවන් / සේවා සැපයීම ඉටු කිරීමේදී පසු පිටෙහි සඳහන් අංක 1 සිට 11 දක්වා සමිතියේ කොන්දේසි වලට අනුව කටයුතු කිරීමට එකඟ වන බවත් ප්‍රකාශ කරමි/කරමු.

.......................................................................... ..............................

නිල මුද්‍රාව සමඟ අත්සන (අයිතිකරු/හවුල්කරු/බලයලත් නිළධාරී) දිනය

**සී/ස අධ්‍යාපන සේවා නියුක්තිකයින්ගේ සමුපකාර සකසුරුවම්කම සහ ණය දෙන සමිතිය**
**අංක:294, ගාලු පාර, කොළඹ 03.**
**දුරකථන අංක : 011-2266000 / වෙබ් අඩවිය :www.edcs.lk**

ආරම්භය: 1930 ලි.ප. අංකය: 736
ஆரம்பம்: 1930 பதிவு இல: 736
Inception: 1930 Reg. No: 736

**සැපයුම් හා සේවා සැපයුම්කරුවන් සඳහා වන පොදු කොන්දේසි මාලාව ,**

1. සැපයුම් හා සේවාවන් සඳහා ලියාපදිංචි වීමේ දී එක් සැපයුම් හෝ සේවා ශීර්ෂයකට වඩා අයදුම්කරන්නේ නම් ඒ සෑම ශීර්ෂයක් සඳහාම ලියාපදිංචි ගාස්තුව වන රු.500/-ක මුදලක් ගෙවා ලබා ගත් කුවිතාන්සියේ අංකය සඳහන් කර වෙන් වෙන් වශයෙන් අයදුම්පත් ඉදිරිපත් කල යුතුය.(මුල් පිටපත ඇමුණුම් කල යුතුය.)
2. සැපයුම්කරුවන් වශයෙන් දැනට සමිතියේ ලියාපදිංචි වී ඇති ආයතන හා පුද්ගලයින් ද 2026 වර්ෂය සඳහා නැවත ලියාපදිංචි විය යුතුය.
3. ලියාපදිංචි සැපයුම්කරුවන්ගේ ලේඛනයෙන් මිළ ගණන් කැඳවීම හා සේවාවන් ඉටුකර ගැනීම, සාමාන්‍ය පිළිවෙත වුවද විශේෂ අවස්ථාවන්හිදී හා සමිතියේ අභිමතය පරිදි ඉන් බාහිරව මිළ කැඳවීම හා සේවාවන් ඉටුකර ගැනීමේ අයිතිය සමිතිය සතුය.
4. සියලු කාර්යාල සඳහා අවශ්‍ය සැපයුම් හා සේවා වෙනුවෙන් මිළ කැඳවීම, ඇණවුම් ලබා දීම හා ප්‍රවාහනය ,ප්‍රධාන කාර්යාලයේ සැපයුම් අංශය මගින් සිදු කරන අතර ,අත්‍යවශ්‍ය වූ හදිස්සි කාර්යයන් පමණක් පළාත් කාර්යාල මට්ටමින් මිළ ගණන් කැඳවා ඉටුකර ගැනීමට කටයුතු කරනු ඇත.
5. මිළ ගණන් කැඳවන අවස්ථාවන්හිදී නියමිත ප්‍රමිතීන්ට හා ආදර්ශයන්ට අනුව සැපයුම් හා සේවාවන් ඉටු නොකරන හා ගිවිසුම් ප්‍රකාරව කටයුතු කිරීම පැහැර හරින සැපයුම්කරුවන්ගේ නම් ලියාපදිංචි ලේඛනයෙන් ඉවත් කිරීමට ක්‍රියා කරනු ඇත.
6. 2026 වර්ෂය සඳහා සැපයුම්කරුවන්ගේ ලේඛනයට ඇතුලත් කර ගන්නා ලියාපදිංචි සැපයුම්කරුවන් වෙත සමිතියේ සේවා අවශ්‍යතාවයන් ලිඛිතව දැනුම් දෙන අතර ඒ සෑම අවස්ථාවකදීම පනවනු ලබන කොන්දේසීන්ට යටත්ව සැපයුම්කරුවන් විසින් මිළ ගණන් ඉදිරිපත් කිරීමට එකඟ විය යුතුය.
7. ලියාපදිංචි සැපයුම්කරුවන්ගේ ලේඛනයට අමතරව වෙනත් ආයතන වෙතින් මිළ ගණන් කැඳවීමේ අයිතිය සමිතිය සතු වන අතර එම මිළ ගණන් පිළිගැනීමට හෝ එම භාණ්ඩ හෝ සේවා සමිතියේ අභිමතය අනුව තෝරා ගත් අය වෙත පැවරීමට ද සමිතියට බලය ඇත.
8. මිළ ගණන් කැඳවීමේ දී ඉදිරිපත් වන මිළ ගණන් පිළිගැනීමට හෝ හේතු දැක්වීමෙන් තොරව ප්‍රතික්ෂේප කිරීමටත් එකී මිළ ගණන් වලින් කොටසක් පිළිගැනීමට හා එම ප්‍රමාණය ඇණවුම් කර අදාල භාණ්ඩ හෝ සේවාව ලබා ගැනීමටත් සමිතියට බලය ඇත.
9. සැපයුම්කරුවන් විසින් සමිතියට සපයනු ලබන භාණ්ඩ හෝ සේවාවන් සමිතිය විසින් ඉල්ලුම් කරන ලද ආදර්ශයන්ට හා ප්‍රමිතීන්ට අනුව නියමිත කාල සීමාවන් තුළ සැපයිය යුතුය. ප්‍රමිතියෙන් හා ගුණාත්මක භාවයෙන් තොර භාණ්ඩ හෝ සේවාවන් ගෙන් කොටසක් හෝ සම්පූර්ණයෙන් ම ප්‍රතික්ෂේප කිරීමට සමිතියට බලය ඇත.
10. නියමිත කාල සීමාව තුළ සැපයීමට අපොහොසත්වන හෝ නිසි ප්‍රමිතියෙන් තොරව සපයන ලද භාණ්ඩ හෝ සේවාවන් වෙනුවෙන් සැපයුම්කරුවන් වෙත ගිවිසගත් ආකාරයට ගෙවීම් නොකිරීමට ද එකී භාණ්ඩ වල ගුණාත්මකභාවය සලකා ඒ අනුව ගණනය කර ගෙවීම් කිරීමට හෝ කිසිදු මුදලක් නොගෙවා ප්‍රතික්ෂේප කිරීමට ද සමිතියට හැකියාව ඇත. එම භාණ්ඩ හෝ සේවාවන් ප්‍රතික්ෂේප කරනු ලැබුවේ නම් සැපයුම්කරුවන් තම වියදමින් ඒවා ඉවත්කර ගත යුතු වේ.
11. ලියාපදිංචි වීමේ අයදුම් පත්‍රයේ අංක 07 යටතේ සඳහන් කර ඇති ණය පහසුකම් සැපයිය හැකි කාල සීමාව සැපයුම්කරුවන් භාණ්ඩ හෝ සේවාවන් සැපයීමෙන් පසු ගෙවීම් කිරීම සඳහා ඇති ණය කාල සීමාව සේ සැලකීමට සමිතිය කටයුතු කරනු ඇත.